ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# ටවර් හෝල් රඟහල පදනම

# තනතුරු ඇබෑර්තු

ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල් තනතුර - (HM 2-1) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණිය**

මෙම තනතුර සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇති ස්ථිර තනතුරකි.

**රැකියා විස්තරය**

අධ්‍යක්ෂ ජනරාල් තනතුර ටවර් හෝල් රඟහල පදනමේ ප්‍රධාන විධායක තනතුර වන අතර භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය ආයතනික ව්‍යුහය හරහා ඉටුකිරීමේ ප්‍රධාන වගකීම මෙම තනතුර සතු වේ. භාරකාර මණ්ඩලයේ මෙහෙයවීම හා පාලනය යටතේ භාරකාර මණ්ඩලය විසින් පවරා දෙනු ලබන කාර්යයන් බලතල ක්‍රියාත්මක කරමින් ආයතනයේ සෙසු කාර්ය මණ්ඩලය සඳහා මගපෙන්වමින් නායකත්වය දෙමින් ආයතනයේ සමස්ත අරමුණු ඉටු කර ගැනීමේ වගකීම මෙම තනතුර සතු වේ.

**අයදුම්කරුවන් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද.**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, නාට්‍ය හා රංගකලා, ප්‍රාසාංගික කලා, සෞන්දර්ය හා ලලිත කලා ජනසන්නිවේදන, අධ්‍යාපනවේදී යන විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් සමග **පශ්චාත් උපාධියක්** ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය, සංස්ථා හෝ පෞද්ගලික අංශයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 20 ක පළපුරුද්දක් තිබිය යුතු අතර එයින් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක විය යුතුය.

(ආ) ඉහත විෂයයන්ගෙන් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම හා ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 05 ක විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** රු. 91645 - 2700 X 12 - 124,045/-

**වයස :** අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය.

(රාජ්‍ය, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**තෝරාගන්නා ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**මෙම තනතුරට හිමිවන වරප්‍රසාද**

I. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දීමනාව ඇතුළු අනෙකුත් සියලු අනුමත දීමනාවන්

II. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 02/2022 අනුව දුරකථන දීමනාව

III. රියැදුරු සමග නිල රථයක් හෝ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015, PED 01/2015 (i) අනුව ප්‍රවාහන දීමනාව

IV. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 (ii) අනුව මාසික ඉන්ධන දීමනාව

V. ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් 2022-04-21 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන), ටවර් හෝල් රඟහල පදනම, සවිසිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ කාර්යාලයීය වේලාවන් තුළදී අතින් ගෙනවිත් භාරදිය යුතු අතර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත ලෙස සඳහන් කළ යුතුය. රාජ්‍ය, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**සැ.යු :**
- මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මේ සම්බන්ධයෙන් සිදුකරනු ලබන සියලු බලපෑම් තෝරාගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ටවර් හෝල් රඟහල පදනම,**
**සවිසිරිපාය,**
**අංක 123, විජේරාම මාවත, කොළඹ 07.**

**විමසීම් : අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) - 0112682324**